සැ. යු. - මෙම අති විශේෂ ගැසට් පත්‍රයෙහි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වෙන වෙනම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1942/22 - 2015 නොවැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2015.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත

**4 (2) වගන්තිය යටතේ කරනු ලබන පළකිරීම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 2015 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට වන වාර්ෂික වැඩි දියුණු කිරීම් සහ හෙළිදරව් කිරීමේ මුල පිරීම (LKAS 1 වෙත සංශෝධන) සම්මත කර 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත පනතේ අරමුණ සඳහා මේ සමග පළකරමි. මෙම වෙනස්වීම් වර්ෂ දෙදහස්දාසයේ ජනවාරි මස පළමු වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2015 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දී ය.

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - PG 2707 — (2015/11)

## 2015 SLFRSs වෙත වාර්ෂික වැඩිදියුණු කිරීම්

**පටුන**

| | |
|---|---|
| | අමතනු ලබන ප්‍රමිත වන්නේ |
| SLFRS 5 | විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම වත්කම් සහ අසන්තතික මෙහෙයුම් |
| SLFRS 7 | මූල්‍ය සාධන පත්‍ර : හෙළිදරව් කිරීම |
| LKAS 19 | සේවක ප්‍රතිලාභ |
| LKAS 34 | අතුරු මූල්‍ය වාර්තාකරණය |

**අමතනු ලබන ප්‍රමිත**

මෙම සංශෝධන මගින් අමතනු ලබන මාතෘකා පහත සඳහන් වගුවෙන් දැක්වේ.

| ප්‍රමිතය | සංශෝධනය කල විෂයය |
|---|---|
| SLFRS 5 විකිණීම සඳහා තබා ඇති ජංගම වත්කම් සහ අසන්තතික මෙහෙයුම් | බැහැර කරන ක්‍රමවල වෙනස්වීම් |
| SLFRS 7 මූල්‍ය සාධන පත්‍රඃ හෙළිදරව් කිරීම් | සේවාකරණ ගිවිසුම |
| | සංක්ෂිප්ත අතුරු මූල්‍ය වාර්තාකරණය වෙත SLFRS 7 සඳහා කරන ලද සංශෝධනවල අදාළත්වය |
| LKAS 19 සේවක ප්‍රතිලාභ | වට්ටම් අනුපාතිකය : ප්‍රාදේශීය වෙළඳපොළ නිකුත් කිරීම් |
| LKAS 34 අතුරු මූල්‍ය වාර්තාකරණය | 'අතුරු මූල්‍ය වාර්තාවක වෙනත් තැනක' හෙළිදරව් කිරීමේ තොරතුරු |

## SLFRS 5 විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම වත්කම් සහ අසන්තතික මෙහෙයුම් සඳහා සංශෝධන

26 - 29 ඡේද සහ ඒවා සම්බන්ධිත ශීර්ෂ පාඨය සංශෝධනය කර සහ 26අ සහ 44ඕ එකතු කෙරේ. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

**විකිණීම සඳහා වන සැලැස්මක් හෝ හිමිකරුවනට බෙදාහැරීමට වන සැලැස්ම වෙනස් කිරීම්**

26 අස්තිත්ත්වයක් වත්කමක් (හෝ බැහැර කිරීම් සමූහයක්) විකිණීමට තබා ඇති ලෙස හෝ හිමිකරුවනට බෙදාහැරීමට ඇති වත්කමක් ලෙස වර්ගීකරණය කර ඇත්නම් එහෙත් 7-9 ඡේදවල (විකිණීම සඳහා තබා ඇති) හෝ 12අ ඡේදයේ (හිමිකරුවනට බෙදාහැරීම සඳහා රඳවා ඇති) නිර්ණායක තවදුරටත් සපුරාලන්නේ නැත්නම් අස්තිත්වය විසින් එම වත්කම (හෝ බැහැර කිරීම් සමූහය) විකිණීම සඳහා තබා ඇති, හෝ හිමිකරුවනට බෙදාහැරීමට තබා ඇති (පිළිවෙළින්) ලෙස වර්ගීකරණය කිරීම නැවැත්විය යුතුය. එවැනි අවස්ථාවල දී මෙම වෙනස්වීම සඳහා ගිණුම්කරණය සඳහා 24අ ඡේදය ව්‍යවහාර වනවිට හැර 27-29 ඡේදවල උපදේශ අස්තිත්ත්වයක් විසින් අනුගමනය කළ යුතුය.

26අ අස්තිත්ත්වයක් විකිණීම සඳහා තබා ඇතිව සිට අයිතිකරුවනට බෙදාහැරීමට සඳහා තබාගෙන ඇති ලෙස සෘජුව හෝ අයිතිකරුවනට බෙදාහැරීම සඳහා තබාගෙන ඇති සිට විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස සෘජුව ප්‍රතිවර්ගීකරණය කරන්නේ නම් එම ප්‍රතිවර්ගීකරණය කිරීමේ වෙනස්වීම මුල් බැහැර කිරීමේ සැලැස්ම අඛණ්ඩව පවත්වාගෙන යන ලෙස සැලකිය යුතුය. එවිට අස්තිත්ත්වයඃ

(අ) මෙම වෙනස්වීම ගිණුම්ගත කිරීම සඳහා 27-29 ඡේදවල උපදේශ අනුගමනය නොකළ යුතුය. නව ක්‍රමයට බැහැර කිරීමට වර්ගීකරණය කළ යුතුය. ඉදිරිපත් කිරීම, සැලසුම්කරණය සඳහා මෙම ප්‍රමිතයේ අදාළ අවශ්‍යතාවයන් අස්තිත්ත්වයක් ව්‍යවහාර කළ යුතුය.

(ආ) 15 වැනි ඡේදයේ (විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස ප්‍රතිවර්ගීකරණය කර ඇත්නම්) හෝ 15අ ඡේදයේ (හිමිකරුවන් සඳහා බෙදාහැරීම සඳහා තබා ගෙන ඇති ලෙස ප්‍රතිවර්ගීකරණය කර ඇත්නම්) අවශ්‍යතාවය අනුව ජංගම නොවන වත්කම මැනිය යුතු සහ 20-25 ඡේදවල අවශ්‍යතාවයන් අනුගමනය කරමින් ජංගම නොවන වත්කමේ (හෝ බැහැර කිරීමේ සමූහය) විකිණීමට වන පිරිවැය/බෙදාහැරීමට වන පිරිවැය අඩුකර සාධාරණ අගයේ යම් අඩුවීමක් හෝ වැඩිවීමක් හඳුනාගත යුතුය.

(ඇ) 8 සහ 12අ ඡේද ප්‍රකාරව වර්ගීකරණය කළ දිනය වෙනස් නොකළ යුතුය. 9 වැනි ඡේදයේ කොන්දේසි සපුරාලන්නේ නම් විකිණීමක් හෝ හිමිකරුවනට බෙදාහැරීමක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය කරනු ලබන කාලපරිච්ඡේදයේ දීර්ග කිරීමක් මෙමගින් වළක්වාලනු නොලැබේ.

27 විකිණීම සඳහා තබා ඇති හෝ හිමිකරුවනට බෙදාහැරීමට තබා ඇති ලෙස (හෝ විකිණීම සඳහා තබා ඇති හෝ හිමිකරුවනට බෙදාහැරීමට තබා ඇති ලෙස වර්ගීකරණය කළ බැහැර කිරීමේ සමූහයට ඇතුළත් කිරීම නවතිනවිට හෝ වර්ගීකරණය කිරීම නැවැත්විය යුතු ජංගම නොවන වත්කම් (හෝ බැහැර කිරීම් සමූහය) අස්තිත්ත්වය විසින් පහත දැ වලින් අඩු අගයට මැනිය යුතුය.

(අ) වත්කම (හෝ බැහැර කිරීම සමූහය) විකිණීම සඳහා තබා ඇති හෝ හිමිකරුවනට බෙදාහැරීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය නොකළේ නම්, යම් ක්ෂය කිරීමක්, ක්‍රමක්ෂය කිරීමක්, හෝ ප්‍රත්‍යාගණනය සඳහා ගැලපූ වත්කම විකිණීම සඳහා තබා ඇති හෝ හිමිකරුවන්ට බෙදාහැරීම

සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කිරීමට පෙර වත්කමේ (හෝ බැහැර කිරීමේ සමූහය) ධාරන අගය සහ

(ආ) විකිණීම හෝ බෙදාහැරීම නොකිරීමට පසුව තීරණය ගත් දින එහි ආපසු අගයක් ගතහැකි වටිනාකම [පාදක සටහන ඉවත් කර ඇත]

28 පිළිවෙලින් 7-9 හෝ 12අ ඡේදවල නිර්ණායක තවදුරටත් සපුරාලනු නොලබන කාලපරිච්ඡේදවල අඛණ්ඩව මෙහෙයුම්වලින් ලාභ හෝ අලාභ [පාදක සටහන ඉවත්කර ඇත] තුළ, විකිණීම සඳහා තබා ඇති හෝ හිමිකරුවනට බෙදාහැරීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කිරීම නැවැත්විය යුතු ජංගම වත්කමක ධාරණ වටිනාකමට අවශ්‍යකරන යම් ගැලපුමක් අස්තිත්ත්වය ඇතුළත් කළ යුතුය. විකිණීම සඳහා තබා ඇති හෝ හිමිකරුවනට බෙදාහැරීමට ලෙස තබා ඇති ලෙස වර්ගීකරණය කිරීම නවත්වනු ලබන බැහැර කිරීම් සමූහය හෝ ජංගම නොවන වත්කම් පරිපාලකයන්, බද්ධ මෙහෙයුමක්, බද්ධ ව්‍යාපාරයක් ආශ්‍රිතයක් හෝ බද්ධ ව්‍යාපාරයක හෝ ආශ්‍රිතයක හිමිකමේ කොටසක් නම්, විකිණීම සඳහා තබා ඇති හෝ හිමිකරුවනට බෙදාහැරීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කළ කාලපරිච්ඡේදවල සිට මූල්‍ය ප්‍රකාශන ඒ අනුව සංශෝධනය කළ යුතුය. 37 වැනි ඡේදය ප්‍රකාරව හඳුනාගත් යම් ප්‍රතිලාභ හෝ අලාභ වෙතොත් ඒවා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත්කිරීමේ දී භාවිතකළ එම සිරස්තලයම යොදාගෙන එම ගැලපුම අස්තිත්ත්වය විසින් ඉදිරිපත්කළ යුතුය.

29 විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස වර්ගීකරණය කළ බැහැර කිරීම් සමූහයකින් අස්තිත්ත්වයක් තනි වත්කමක් හෝ වගකීමක් ඉවත්කරන්නේ නම්, බැහැර කිරීම් සමූහයේ විකිණීමට ඇති ඉතිරිව ඇති වත්කම් සහ වගකීම් සමූහයක් ලෙස මැනීම අඛණ්ඩව පවත්වාගෙන යායුත්තේ 7-9 ඡේදවල නිර්ණායක සමූහය විසින් සපුරාලන්නේ නම් පමණක්ය. හිමිකරුවනට බෙදාහැරීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කළ බැහැර කිරීම් සමූහයක් අස්තිත්ත්වයක් තනි වත්කමක් හෝ වගකීමක් ඉවත්කරන්නේ නම් බැහැර කිරීම් සමූහයේ බෙදාහැරීමට ඉතිරිව ඇති වත්කම් සහ වගකීම් සමූහයක් ලෙස මැනීම අඛණ්ඩව පවත්වාගෙන යා යුත්තේ 12අ ඡේදයේ නිර්ණායක සමූහය විසින් සපුරාලන්නේ නම් පමණක්ය. එසේ නැතහොත් විකිණීමට තබා ඇති ලෙස (හෝ හිමිකරුවනට බෙදාහැරීම සඳහා තබා ඇති ලෙස) වර්ගීකරණය සඳහා නිර්ණායකය තනිව සපුරාලන ඉතිරිව ඇති සමූහයේ ජංගම නොවන වත්කම් එම දිනයේ ඒවායේ ධාරණ වටිනාකමෙන් සහ සාධාරන අගයේ විකිණීමට වන පිරිවැය (හෝ බෙදාහැරීමට වන පිරිවැය) අඩුකළ පසු වන අඩු වටිනාකමට තනි තනිව මැනිය යුතුය. විකිණීම සඳහා තබාගෙන ඇති නිර්ණායකය සපුරා නොලබන යම් ජංගම නොවන වත්කම් 26 වැනි ඡේදය ප්‍රකාරව විකිණීම සඳහා තබා ඇති ලෙස (වර්ගීකරණය කිරීම නවතිනු ඇත.) හිමිකරුවනට බෙදාහැරීම සඳහා තබාගෙන ඇති නිර්ණායකය සපුරා නොලබන යම් ජංගම නොවන වත්කම් 26 වැනි ඡේදය ප්‍රකාරව හිමිකරුවනට බෙදාහැරීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කිරීම නවතිනු ඇත.

...

**බලාත්මක දිනය**

...

44ඕ 2015 SLFRSs වලට වාර්ෂික වැඩිදියුණු කිරීම්, 26-29 ඡේද සංශෝධනය කර ඇත සහ 26අ ඡේදය එකතු කර ඇත. 2016 ජනවාරි 1 වැනි දින හෝ ඉන්පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේදවල ද සිදුවන බැහැර කිරීමේ ක්‍රමයට වන වෙනස්කම් LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් ප්‍රකාරව අනාගතයට බලපාන පරිදි අස්තිත්ත්වයන් එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

කලින් ව්‍යවහාර කරණයට අවසර දේ. අස්තිත්ත්වයක් එම සංශෝධන කලින් කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යවහාර කරන්නේ නම් එම කරුණු හෙළිදරව් කළ යුතු ය.

## SLFRS 7 මූල්‍ය සාධන පත්‍ර : හෙළිදරව් කිරීම්වලට සංශෝධන

| |
|---|
| 44අඊ ඡේදය සංශෝධනය කර ඇත සහ 44අඅ ඡේද එකතු කර ඇත. ඉවත් කළ ඡේද කපාහැර ඇත. නව ඡේදය යටින් ඉරක් ඇඳ ඇත. |

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

44අඊ හෙළිදරව් කිරීම - මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කිරීම (SLFRS 7 ට සංශෝධන) 13අ - 13ඊ සහ ආ40 - ආ53 ඡේද එකතු කර ඇත. අස්තිත්ත්වයක් විසින් මෙම සංශෝධන 2013 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සහ එම වාර්ෂික කාලපරිච්ඡේද තුළවන අතුරු කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කළ යුතුය. අතීතයට බලපාන පරිදි එම සංශෝධන සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් අස්තිත්ත්වයක් විසින් ලබාදිය යුතු ය.

...

44අඅ 2015 SLFRSs වලට වාර්ෂික වැඩිදියුණු කිරීම්. 44අඊ සහ ආ30 සංශෝධනය කළ ඡේද සහ ආ30අ ඡේදය එකතු කර ඇත. අස්තිත්ත්වයක් මෙම සංශෝධන මුලින්ම ව්‍යවහාර කළ වාර්ෂික කාලපරිච්ඡේද ආරම්භවීමට පෙර ඉදිරිපත් කළ යම් කාලපරිච්ඡේදයක් සඳහා ආ30 සහ ආ30අ ඡේදවල සංශෝධන අස්තිත්ත්වයක් විසින් ව්‍යවහාර කිරීම අවශ්‍ය නොවන අතර, 2016 ජනවාරි 1 දින හෝ ඉන්පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව අතීතයට බලපාන පරිදි අස්තිත්ත්වයන් එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය. 44අඊ ආ30 සහ ආ30අ ඡේද කලින් ව්‍යවහාරකරණයට අවසර දේ. අස්තිත්ත්වයක් එම සංශෝධත කලින් කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යවහාර කරන්නේ නම් එම හෙළිදරව් කළ යුතු ය.

| |
|---|
| ආ පරිශිෂ්ඨයේ ආ 30 ඡේදය සංශෝධනය කර ඇත සහ ආ30අ ඡේදය එකතු කර ඇත. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

**අඛණ්ඩ සම්බන්ධතාවය (42 ආ ඡේදය)**

...

ආ30 පැවරුමේ කොටසක් ලෙස පැවරූ වත්කමේ යම් ගිවිසුම්ගත අයිතීන් හෝ ආවේණික බැඳියාවන් රඳවාගෙන නොමැති සහ පැවරූ මූල්‍ය වත්කමට සම්බන්ධිත යම් නව ගිවිසුම්ගත අයිතීන් හෝ බැඳියාවන් රඳවාගෙන නොමැති නම් පැවරූ මූල්‍ය වත්කමේ සම්බන්ධයේ අඛණ්ඩ සම්බන්ධතාවය අස්තිත්ත්වයට නොමැත. පැවරූ මූල්‍ය වත්කමේ අනාගත කාර්යසාධනය පිළිබඳ ඇල්මක් නොමැති නම් සහ අනාගතයේ දී පැවරූ මූල්‍ය වත්කම සම්බන්ධයෙන් කුමන තත්ත්වයක් යටතේ ගෙවීමක් කිරීමට වගකීමක් නොමැතිනම් පැවරූ මූල්‍ය වත්කම සම්බන්ධයෙන් අස්තිත්ත්වයට අඛණ්ඩ සම්බන්ධතාවයක් නොමැත. මෙම සන්දර්භයේ දී 'ගෙවීම්' යන පදයට පැවරූ මූල්‍ය වත්කමේ මුදල් ප්‍රවාහ පැවරුම්ලාභියාට ප්‍රේෂණය කිරීමට අවශ්‍යකරන මුදල් ප්‍රවාහ රැස් කිරීම ඇතුළත් නොවේ.

ආ30අ අස්තිත්ත්වයක් මුල්‍ය වත්කමක පැවරීමේ දී, අස්තිත්ත්වය විසින් ගාස්තුවක් අයකර එම මුල්‍යවත්කම සේවා කරණය සඳහා වන අයිතියක් රඳවා තබාගත හැකිය, උදාහරණ වශයෙන් සේවාකරණ ගිවිසුමක්. හෙළිදරව් කිරීමේ අරමුණ සඳහා සේවාකරණ ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස අස්තිත්ත්වයට අඛණ්ඩ සම්බන්ධතාවයන් ඇත්දැයි තීරණය කිරීමට 42ඇ සහ ආ30 ඡේදවල උපදේශන ප්‍රකාරව අස්තිත්ත්වය සේවාකරණ ගිවිසුම තක්සේරු කරයි. උදාහරණයක් ලෙස පැවරූ මූල්‍ය වත්කමේ සේවාකරණ ගාස්තුව රඳා පවත්තේ, රැස්කරගන්නා වටිනාකම හෝ කාලනිර්ණය මතනම්, හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් හි අරමුණ සඳහා සේවා සපයන්නා හට අඛණ්ඩ සම්බන්ධතාවයක් ඇත. ඒ හා සමානව පැවරූ මූල්‍ය වත්කම සඳහා සේවා ඉටු නොකිරීම නිසා ස්ථාවර ගාස්තුව සම්පූර්ණයෙන් නොගෙවන්නේ නම් හෙළිදරව් කිරීමේ අවශ්‍යතා අරමුණ සඳහා සේවා සපයන්නාහට අඛණ්ඩ සම්බන්ධතාවයක් ඇත. මෙම උදාහරණවල සේවා සපයන්නා හට පැවරූ මූල්‍ය වත්කම් සඳහා අනාගත ඉටුකිරීම් සඳහා වගකීමක් සේවා සපයන්නා හට ඇත. සේවාව ඉටුකිරීම වෙනුවෙන් ලැබීමට අපේක්ෂිත ගාස්තුව මගින් අස්තිත්ත්වය ප්‍රමාණවත් ලෙස හානිපූර්ණය වන්නේද යන්න මගින් ස්වාධීනව මෙම ඇස්තමේන්තුව සිදු කෙරේ.

## SLFRS 1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට භාවිතා කිරීමට ආනුශංගික සංශෝධන

39අඅ ඡේදය එකතු කර ඇත. නව ඡේදය යටින් ඉරක් ඇඳ ඇත.

**බලාත්මක දිනය**

...

39අඅ 2015 SLFRSs වලට වාර්ෂික වැඩිදියුණු කිරීම්. ඉ4අ ඡේදය එකතු කර ඇත. 2016 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා අස්තිත්ත්වයක් එම සංශෝධනය ව්‍යවහාර කළ යුතුය. ඊට කලින් ව්‍යවහාරකරණයට අවසර දේ. එම සංශෝධනය අස්තිත්ත්වයක් කලින් කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ හෙළිදරව් කළ යුතු ය.

ඉ පරිශිෂ්ඨයේ, ඉ4අ ඡේදය එකතු කර ඇත. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

**මුල්‍ය සාධන පත්‍ර සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම්**

...

ඉ4අ ප්‍රථම වරට භාවිත කරන්නෙක් SLFRS 7 හි 44අඅ ඡේදයේ සංක්‍රාන්ති ප්‍රතිපාදන ව්‍යවහාර කළ හැකි ය.

## LKAS 19 සේවක ප්‍රතිලාභවලට සංශෝධන

83වන ඡේදය සංශෝධනය කර ඇත සහ 176-177 ඡේද එකතු කර ඇත. ඉවත්කළ පාඨය කපාහැර ඇත සහ නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත.

**ආයුගණක උපකල්පන : වට්ටම් අනුපාතිකය**

83 **පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම් (අරමුදල්කරණය කරන ලද සහ අරමුදල්කරණය නොකළ යන දෙකම) වට්ටම් කිරීම සඳහා වන අනුපාතිකය භාවිතා කළ යුත්තේ වාර්තාකරන ලද කාලපරිච්ඡේදය අවසානයේ**

දී ඉතා ඉහළ තත්ත්වයක් සංස්ථාපිත බැඳුම්කරවල වෙළෙඳපොළ ඵලදාවට යොමුකිරීම මගින් නිර්ණය කිරීමෙනි. එවැනි ඉතා ඉහළ තත්ත්වයේ සංස්ථාපිත බැඳුම්කර සඳහා තියුණු වෙළඳ පොළක් නැති රටවල්, ව්‍යවහාර මුදල් සඳහා එම ව්‍යවහාර මුදලින් නම්කළ රජයේ බැඳුම්කර සඳහාවන වෙළඳපොළ ඵලදාව (වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසාන) භාවිත කළ යුතුය. සංස්ථාපිත බැඳුම්කර හෝ රජයේ බැඳුම්කරවල ව්‍යවහාර මුදල් සහ කොන්දේසි පශ්චාත්-සේවක ප්‍රතිලාභ බැඳීම්වල ව්‍යවහාර මුදල් සහ ඇස්තමේන්තුකල කොන්දේසි සමග සංගත විය යුතු ය.

...

**සංක්‍රාන්තිය සහ බලාත්මක දිනය**

...

176 2015 SLFRSs වලට වාර්ෂික වැඩිදියුණු කිරීමේ, 83 වන ඡේදය සංශෝධනය කර ඇත සහ 177 ඡේදය එකතු කර ඇත. 2016 ජනවාරි මස 1 වැනි දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා අස්තිත්ත්වයක් එම සංශෝධනය ව්‍යවහාර කළ යුතු ය. කලින් ව්‍යවහාර කිරීමට අවසර දේ. කලින් කාලපරිච්ඡේදයක් සඳහා අස්තිත්ත්වයක් එම සංශෝධනය ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ හෙළිදරව් කළ යුතු ය.

177 එම සංශෝධනය අස්තිත්ත්වය විසින් ව්‍යවහාර කළ ප්‍රථම මූල්‍ය ප්‍රකාශවල කලින්ම ඉදිරිපත් කළ තුළනාත්මක කාලපරිච්ඡේදය ආරම්භයේ සිට 176 වන ඡේදයේ ඇති සංශෝධනය අස්තිත්ත්වයක් විසින් ව්‍යවහාර කළ යුතු ය.

## LKAS 34 අතුරු මූල්‍ය වාර්තාකරණය සඳහා සංශෝධන

16අ ඡේදය සංශෝධනය කර ඇත සහ 56 වන ඡේදය එකතු කර ඇත. ඉවත්කළ පාඨය කපාහැර ඇත සහ නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත.

**වෙනත් හෙළිදරව් කිරීම්**

16අ 15-15ඇ ඡේද ප්‍රකාරව සැලකිය යුතු අන්දමේ සිද්ධීන් සඳහා ගනුදෙනු හෙළිදරව් කිරීමට අමතරව, අතුරු මූල්‍ය වාර්තාවල වෙනත් තැනක හෝ හෙළිදරව් කර නොමැති නම්, අස්තිත්වයක් එහි අතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල පහත සඳහන් තොරතුරු තොරතුරු ඇතුළත් කළ යුතුය. අතුරු මූල්‍ය වාර්තා ලබාගැනීමේ එම කොන්දේසි මත සහ ඒ වේලාවට මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්හට ලබාගත හැකි එක්කෝ අතුරු මූල්‍ය ප්‍රකාශනවල හෝ මූල්‍ය වාර්තාවලින් හරස් යොමුකර අන්තර්ගත කරන වෙනත් ප්‍රකාශනවලට (කළමනාකරණ විස්තරය හෝ අවදානම් වාර්තාව) අස්තිත්ත්වයට පහත සඳහන් හෙළිදරව් කිරීම් කළ යුතු ය. මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්හට එම කොන්දේසි සහ එම වේලාවට ලබාගත හැකිව විය යුතු හරස් යොමුකළ ඇතුළත් කළ තොරතුරු සඳහා ප්‍රවේශ වීමට නොහැකි නම් එම අතුරු මූල්‍ය වාර්තා අසම්පූර්ණය. මෙම තොරතුරු සාමාන්‍යයෙන් මුදල් වර්ෂයකට මේ දක්වා පදනම මත සාමාන්‍යයෙන් වාර්තා කළ යුතු ය.

(අ) ...

**බලාත්මක දිනය**

...

56 *SLFRSs 2015 ට වාර්ෂික වැඩිදියුණු කිරීම්* 16අ. ඡේදය සංශෝධනය කර ඇත. 2016 ජනවාරි මස 1 වැනි දින හෝ ඉන්පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව මෙම සංශෝධනය අතීතයට බලපාන පරිදි අස්තිත්ත්වයක් ව්‍යවහාර කළ යුතු ය. කලින් ව්‍යවහාරකරණයට අවසර දේ. අස්තිත්ත්වයන් මෙම සංශෝධනය කලින් කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යවහාර කරන්නේ නම් එම කරන හෙළිදරව් කළ යුතු ය.

## හෙළිදරව් කිරීමේ මුලපිරීම

## (LKAS 1 ට සංශෝධන)

**පටුන**

LKAS 1 ට සංශෝධන

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

උපදේශ ක්‍රියාත්මක කිරීම මත මූල්‍ය ප්‍රකාශනවලට ආනුශංගික සංශෝධන

වෙනත් ප්‍රමිත

## LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම වෙත සංශෝධන

10, 31, 54-55, 82අ, 85, 113-114, 117, 119 සහ 122 ඡේද සංශෝධනය කර ඇත. 30අ, 55අ, 85අ-85ආ සහ 139අඇ ඡේද එකතු කර ඇත සහ 15 සහ 120 යන ඡේද ඉවත්කර ඇත. 29-30, 112, 116, 118 සහ 121 සංශෝධනය කර නොමැති වුව ද යොමුකිරීමේ පහසුව සඳහා එය ඇතුළත් කර ඇත. ඉවත්කළ ඡේද කපාහැර ඇති අතර සහ නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත.

### සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක්

10 සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පහත දැවලින් සමන්විත වේ.

(අ) කාලපරිච්ඡේදය අවසාන දිනයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක්.

(ආ) කාල පරිච්ඡේදය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයක්

(ඇ) කාලපරිච්ඡේදය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයක්

(ඈ) කාලපරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක්

(ඉ) වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පහදාදීමේ තොරතුරුවලින් සමන්විත සටහන්

**(ඉඅ)** **38 සහ 38 අ ඡේදවල නිශ්චය කර ඇති පරිදි පූර්ව කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් තුලනාත්මක තොරතුරු, සහ**

**(ඊ)** **අස්තිත්ත්වයක් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අතීතයට බලපාන පරිදි අනුගමනය කරන විට හෝ සිය මූල්‍ය ප්‍රකාශනවල අයිතිම අතීතයට බලපාන පරිදි නැවත ප්‍රකාශ කරන විට හෝ එය 40 අ - 40 ඈ ඡේද ප්‍රකාරව සිය මූල්‍ය ප්‍රකාශනවල අයිතම ප්‍රතිවර්ගීකරණය කරන විට පූර්ව කාලපරිච්ඡේදය ආරම්භයෙහි මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනය.**

ප්‍රකාශන සඳහා අස්තිත්ත්වයක් මෙම ප්‍රමිතයේ ඇති මාතෘකාව හැර වෙනත් මාතෘකා යොදාගත හැකිය. උදාහරණ වශයෙන් අස්තිත්ත්වය විසින් ලාභ හෝ අලාභ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය වෙනුවට 'විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය' යන මාතෘකාව භාවිත කළ හැකිය.

...

ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

**29.** **එක් එක් ප්‍රමාණාත්මක පන්තිවල එක හා සමාන අයිතම අස්තිත්ත්වයක් වෙනම ඉදිරිපත් කළ යුතුය. ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර ස්වභාවෙන් සහ ක්‍රියාකාරී බවෙන් අසමාන අයිතිම අස්තිත්ත්වයක් වේනම ඉදිරිපත් කළ යුතුය.**

30. විශාල සංඛ්‍යාවක ගණුදෙනු හෝ වෙනත් සිද්ධීන් ක්‍රියාවලිවලට නංවා ඒවායේ ස්වභාවය සහ ක්‍රියාවන් අනුව පංතිවලට සමාහරණ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වාර්තා ඇති වේ. සමාහරණය සහ වර්ගීකරණය කිරීමේ ක්‍රියාවලියේ අවසාන අදියර වන්නේ මූල්‍ය ප්‍රකාශනවල පේළි අයිතිම ලෙස දක්වෙන සංක්ෂිප්ත සහ වර්ගීකරණය කළ දත්ත ඉදිරිපත් කිරීමය. තනි තනිව ගත් කළ පේළි අයිතමයක් ප්‍රමාණාත්මක නොවේ නම්, එම පේළි අයිතමය එම ප්‍රකාශනවල වෙනත් අයිතම් හෝ සටහන් සමඟ සමාහරණය කෙරේ. මෙම ප්‍රකාශනවල වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ලෙස වැදගත් යයි සාධාරණීයකරණය කළ නොහැකි අයිතමයක්, සටහන්වලට වෙනම ඉදිරිපත් කිරීම සඳහා සාධාරණීයකරණය කළ හැකිය.

30අ. සියළුම සම්බන්ධිත කරුණු සහ තත්ත්වයන් සැලකිල්ලට ගෙන, සටහන්ද ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු සමාහරණය කළේ කෙසේද යන්න. අස්තිත්ත්වයක් විසින් මෙම ප්‍රමිතය සහ වෙනත් SLFRS ව්‍යවහාර කිරීමේ තීරණය කරනු ඇත. ප්‍රමාණාත්මක තොරතුරු, ප්‍රමාණාත්මක නොවන තොරතුරු සමඟ සැඟවීමෙන් සහ වෙනස් ස්වභාවයේ කාර්යයන් ඇති ප්‍රමාණාත්මක අයිතම සමඟ සමාහරණය කිරීමෙන් අස්තිත්ත්වයන් එහි මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීමේ හැකියාව අඩු නොකළ යුතුය.

31. මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම අවශ්‍යකරන තොරතුරු සටහන්ද ඇතුළුව මොනවාදැයි සමහර SLFRSs වල පැහැදිලිව සඳහන් කර ඇත. යම් තොරතුරක් හෙළිදරව් කිරීමෙන් එම තොරතුරු ප්‍රමාණාත්මක නොවීම ප්‍රතිඵලයක් වන්නේ නම් SLFRS මගින් අවශ්‍යකරන පැහැදිලිව සඳහන්කළ තොරතුරක් ලබාදීම අවශ්‍ය නොකෙරේ. මේ සඳහා අවස්ථාවක් වන්නේ පැහැදිලිව සඳහන් කළ අවශ්‍යතාවයක් හෝ විස්තර කිරීම් ලැයිස්තුවක් SLFRS යක අඩංගුවන විටදී වුවය. අස්තිත්ත්වයක් මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳව විශේෂ සිද්ධියක දී වෙනත් සිද්ධියක් සහ තත්වයන්ගේ බලපෑම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන් හට අවබෝධයක් ලබාගැනීමට හැකිවනු වස්, SLFRS හි පැහැදිලිව සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සමඟ අනුගත වීම ප්‍රමාණවත් නොවන්නේ නම්, අස්තිත්ත්වය එලෙස අමතර හෙළිදරව් කිරීම ලබාදිය යුතු දැයි සළකා බැලිය යුතුය.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක ඉදිරිපත් කළ යුතු තොරතුරු**

54. අඩුම තරමින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දැක්වෙන වටිනාකම් ඉදිරිපත් කරන පේළි අයිතම ඇතුළත් විය යුතුය,

(අ) ...

55. අමතර පේලි අයිතම (54 වන ඡේදයේ ලැයිස්තුගත පේළි අයිතම කොටස්වලට විසුරු හැරීම මඟින්ද ඇතුළු) ශීර්ෂ සහ උප එකතුවන්, අස්තිත්ත්වයක මූල්‍ය තත්ත්වය අවබෝධකර ගැනීම සඳහා එම ඉදිරිපත් කිරීම අදල වන විට අස්තිත්ත්වයක් ඉදිරිපත් කළ යුතුය.

55අ. 55 වන ඡේදය ප්‍රකාරව අස්තිත්ත්වයක් උප එකතුවක් ඉදිරිපත් කරන වට එම උප එකතුවන් තුළ ඃ

(අ) SLFRS ප්‍රකාරව හඳුනාගත් සහ මනින ලද වටිනාකම් සෑදී ඇති පේලි අයිතම් වලින් යුක්ත විය යුතුය.

(ආ) උප එකතුවන්ගෙන් සමන්විත පේළි අයිතම පැහැදිලිව සහ අවබෝධ කර ගැනීමට හැකිවන ආකාරයකට ලේබල් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) 45 වන ඡේදය ප්‍රකාරව කාලපරිච්ඡේදයෙන් කාලපරිච්ඡේදයට සංගත විය යුතු; සහ

(ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා SLFRS වලින් අවශ්‍ය කරන උප එකතුන් සහ එකතුවන් වලට වඩා කැපී පෙනෙන ලෙස පෙනෙන්නට නොසැලැස්විය යුතුය.

**වෙනත් විස්තීර්ණ ආදායම් කොටසෙ ඉදිරිපත් කළ යුතු තොරතුරු**

82අ. කාලපරිච්ඡේදය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් කොටසේ පහත වටිනාකම් සඳහා පේළි අයිතම ඉදිරිපත් කළ යුතුය. ස්වභාවය අනුව වර්ගීකරණය කළ (ස්කන්ධ ක්‍රමය භාවිත කර ගිණුම්ගත කළ ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාරවල විස්තීර්ණ ආදායමේ කොටස ඇතුළුව) සහ වෙනත් SLFRSS ප්‍රකාරව ඒවාට කාණ්ඩ ගත කළ කාලපරිච්ඡේදය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්.

(අ) වෙනත් SLFRS ප්‍රකාරව ඒවාට කාණ්ඩ ගත කළ කාලපරිච්ඡේදය සඳහා වර්ගීකරණය කළ වෙනත් විස්තීර්ණ ආදායමේ අයිතම ((ආ) ඡේදයේ ඇතුලත් වටිනාකම් හැර)

(i) පසුව ලාභ හෝ අලාභවලට ප්‍රතිවර්ගිකරණය කරනු නොලබන; සහ

(ii) නිශ්චය කරන ලද කොන්දේසියක් සපුරාලන විට පසුව ලාභ හෝ අලාභවලට ප්‍රතිවර්ගීකරණය කරන

(ආ) වෙනත් SLFRSS ප්‍රකාරව වෙන් කරන ලද අයිතමවල කොටස, ස්කන්ධ ක්‍රමය භාවිත කර ගිණුම්ගත කළ ආශ්‍රිත සහ බද්ද ව්‍යාපාරවල වෙනත් විස්තීර්ණ ආදායම් කොටස;

(i) පසුව ලාභයෙන් අලාභවලට ප්‍රතිවර්ගීකරණය කරනු නොලබන; සහ

(ii) නිශ්චය කරන ලද කොන්දේසියක් සපුරාලන විට පසුව ලාභ හෝ අලාභවලට ප්‍රතිවර්ගීකරණය කරන,

85. **අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධන අවබෝධකර ගැනීමට එවැනි ඉදිරිපත් කිරීමක් අදාළ වන විට, ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන(වල) යේ අස්තිත්ත්වයක් අතිරේක පේළි අයිතම් (82 වන ඡේදයේ) ලැයිස්තුගත කර ඇති පේළි අයිතිම කොටස්වලට විසුරුවා හැරීම ඇතුළුව ශීර්ෂ සහ උප එකතුන් අස්තිත්ත්වය ඉදිරිපත් කළ යුතු ය.**

85අ. 85 වන ඡේදය ප්‍රකාරව අස්තිත්ත්වයක් උප එකතුන් ඉදිරිපත් කරන විට එම උප එකතුවන්;

(අ) SLFRS ප්‍රකාරව හඳුනාගත් සහ මනින ලද වටිනාකම් සැදී ඇති පේළි අයිතම් වලින් යුක්ත යුතු ය.

(ආ) උප එකතුන්වලින් සමන්විත පේළි අයිතම පැහැදිලි කර අවබෝධකර ගත හැකි වන ආකාරයට ලේබල් කර ඉදිරිපත් කළ යුතු වීම,

(ඇ) 45 වන ඡේදය ප්‍රකාරව කාල පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට සංගත විය යුතු; සහ

(ඈ) ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයන් (යක) සඳහා SLFRS වලින් අවශ්‍ය කරන උප එකතුන් සහ එකතුන්වලට වඩා කැපී පෙනෙන ලෙස පෙනෙන්නට නොසැලැස්විය යුතු ය.

85ආ. 85 වන ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කරන යම් උප එකතුන් SLFRS වලින් අවශ්‍ය කරන එවැනි ප්‍රකාශනයක් (න්) සඳහා අවශ්‍ය කරන යම් උප එකතුන් හෝ එකතුන් සමග සංසන්දනය කරන ලාභ හෝ අලාභ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ඉදිරිපත් කරන ප්‍රකාශනයක් (න්) පේළි අයිතම අස්තිත්ත්වයක් ඉදිරිපත් කළ යුතු ය.

**ව්‍යූහය**

112. සටහන්වලට පහත දේ අතුළත් විය යුතු ය.

(අ) **117- 124 ඡේද ප්‍රකාරව භාවිත කළ නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ පදනම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.**

(ආ) **SLFRS මගින් අවශ්‍යකරණ මූල්‍ය ප්‍රකාශනවල අන් තැනක ඉදිරිපත් කර නොමැති තොරතුරු හෙළිදරව් කළ යුතු ය.**

(ඇ) **මූල්‍ය ප්‍රකාශනවල අන් තැනක ඉදිරිපත් කර නොමැති, ඒවායින් ඕනෑම කරුණක් අවබෝධ කර ගැනීමට අදාළ තොරතුරු ලබාදිය යුතු ය.**

113 අස්තිත්ත්වයක් හැකිතාක් ප්‍රායෝගිකවන අන්දමට සටහන් ක්‍රමානුකූලව ඉදිරිපත් කළ යුතුය. ක්‍රමානුකූල අන්දම නිර්ණය කිරීමේ එහි මූල්‍ය ප්‍රකාශනවල අවබෝධකර ගත හැකි බව සහ සංසන්දනාත්මක භාවයට වන බලපෑම අස්තිත්ත්වය සැළකිල්ලට යුතුය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තිර්ණ ආදායම් ප්‍රකාශන, සහ ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ සටහන් වලට සම්බන්ධිත තොරතුරුවල ඇති සෑම අයිතමයක් වෙත අස්තිත්ත්වය හරස් යොමු කිරීම් කළ යුතුය.

114. පරිශීලකයන්ට මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීමට සහ ඒවා වෙනත් අස්තිත්ත්වවල මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීමට උදව්වනු වස් අස්තිත්ත්වයක් සටහන් සාමාන්‍යයෙන් පහත දැක්වෙන අනුපිළිවෙල අනුව ඉදිරිපත් කරයි. සටහන් ක්‍රමානුකූල ලෙස අනුපිළිවෙලකට ඉදිරිපත් කිරීම සහ කාණ්ඩ ගත කිරීමට වන උදාහරණවලට පහත දෑ ඇතුළත් වේ.

(අ) විශේෂ මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු එකම කාණ්ඩ ගත කිරීම වැනි එහි මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය අවබෝධ කර ගැනීමට වඩාත් අදාළ යයි අස්තිත්ත්වය සලකනු ලබන ප්‍රදේශ වඩාත් කැපී පෙනෙන ලෙස ඉදිරිපත් කිරීම සහ කාණ්ඩ ගත කිරීම.

(ආ) සාධාරණ අගයට මනින ලද වත්කම් වැනි එක හා සමාන ලෙස මනින අයිතම පිළිබඳව තොරතුරු එකට කාණ්ඩ ගත කිරීම; හෝ

(ඇ) පහත සඳහන් පරිදි, ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායමේ සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පේළි අයිතම පහත සඳහන් අනුපිළිවෙල අනුගමනය කරමින් ඉදිරිපත් කිරීම.

(i) SLFRSS සමඟ අනුගත වීමේ ප්‍රකාශනය (16 වන ඡේදය)

(ii) ව්‍යවහාර කළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සරාංශයක් (117 ඡේදය බලන්න)

(iii) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් සහ ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනවල අයිතම සඳහා ඉදිරිපත් කළ සහාය වන තොරතුරු සෑම ප්‍රකාශනයකම සහ සෑම පේළි අයිතමයක් ඉදිරිපත් කළ අනුපිළිවෙල අනුව ඉදිරිපත් කිරීම.

(iv) පහත දෑ ඇතුළු වෙනත් හෙළිදරව් කිරීම් :

(1) අසම්භව්‍ය වගකීම් (LKAS 37 බලන්න) සහ හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳියාවන් සහ,

(2) මූල්‍ය නොවන හෙළිදරව් කිරීම් උදා. අස්තිත්ත්යේ මූල්‍ය අවදානම් කලමනාකරණයේ අරමුණු සහ ප්‍රතිපත්ති (SLFRS 7 බලන්න)

115. [ඉවත් කරන ලදී.] සමහර තත්ත්වයන්හීදී සටහන්වල ඇති නිශ්චිත අයිතමවල අනුපිළිවෙල වෙනස් කිරීමට අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකිය. උදාහරණ වශයෙන් අස්තිත්ත්වය ලාභ හෝ අලාභවල හඳුනාගත් සාධාරණ අගය වෙනස්වීම් මූල්‍ය සාධනපත්‍ර පරිනත වීම මත තොරතුරු සමඟ සංයෝජනය කළ හැකිය. එසේ වුවද පෙර සඳහන් හෙළිදරව් කිරීම් ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ඉදිරිපත් කිරීමට සම්බන්ධිත අතර පසුව සඳහන් හෙළිදරව් කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට සම්බන්ධිත වේ. එසේවුව ද ප්‍රායෝගික වන තාක් දුරට අස්තිත්ත්වය සටහන් සඳහා ක්‍රමානුකූල ව්‍යුහයක් රඳවා තබා ගනී.

116. අස්තිත්ත්වයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම සහ නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු ලබාදෙමින්, මූල්‍ය ප්‍රකාශනවල වෙනම කොටසක සටහන් ඉදිරිපත් කළ හැකිය.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම

**117. අස්තිත්ත්වයක් එහි පහත සඳහන් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත හෙළිදරව් කළ යුතු ය.**

**(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කළ මැනීමේ පදනම (හෝ පදනම්)ත සහ**

**(ආ) මූල්‍ය ප්‍රකශන අවබෝධ කර ගැනීමට අදාළවන භාවිත කල වෙනත් ගිණුම්කරණ ප්‍රතිපත්ති.**

118. අස්තිත්ත්වය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන පදනම පරිශීලකයන්ගේ විශ්ලේෂණයට සැලකිය යුතු අන්දමින් බලපාන නිසා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී භාවිත කළ මැනීමේ පදනම හෝ පදනම් (උදාහරණ වශයෙන්, ඓතිහාසික පිරිවැය, ප්‍රවර්තන පිරිවැය, ශුද්ධ උපලබ්ධි අගය සාධාරණ අගය හෝ අයකරගත හැකි වටිනාකම) පරිශිලකයනට දැන්වීම වැදගත් වේ. මූල්‍ය ප්‍රකාශන තුළ එක මැනීමේ පදනමකට වඩා වැඩි මැනීමේ පදනම් භාවිත කරන විට, උදාහරණ වශයෙන් විශේෂ පන්තියක වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට එක් එක් මැනීමේ පදනම ව්‍යවහාර කළ වත්කම් හෝ වගකීම් ප්‍රභේදනයන් පිළිබඳ ඇඟවීමක් ලබාදීම ප්‍රමාණවත් වේ.

119. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හෙළිදරව් කළ යුතු දැයි තීරණය කිරීමේ දී කළමනාකාරිත්වය විසින්, වාර්තාකර ඇති මූල්‍ය කාර්ය සාධන සහ මූල්‍ය තත්ත්වය පිළිබිඹුවන ගණුදෙනු වෙනත් සිද්ධීන් සහ තත්ත්වයන් පරිශීලකයන් අවබෝධකර ගැනීමට කෙසේ උපකාරිවන්නේ ද යන්න සළකා බැලිය යුතු ය. <u>එම වර්ගයේ අස්තිත්තවයන් සඳහා එහි මූල්‍ය ප්‍රකාශනවලින් පරිශීලකයකු අපේක්‍ෂා කරන එහි මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම පිළිබඳව අස්තිත්ත්වයන් සළකා බැලිය යුතුය</u>. විශේෂයෙන්ම විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම ඒවා SLFRS, මගින් විකල්පයන් සඳහා ඉඩ දී ඇතිවිට තෝරාගන්නා එම ප්‍රතිපත්තිවලින් තෝරා ගන්නට පරිශීලකයෙකුට වැදගත් වේ. උදාහරණයක් වන්නේ එහි ආයෝජන දේපොළ සඳහා (LKAS 40 *ආයෝජන දේපළ බලන්න*) අස්තිත්ත්වයක් සාධාරණ අගය හෝ පිරිවැය ආකෘතිය ව්‍යවහාර කරන්නේ ද යන වගඃ ඉඩදී ඇති වෙනස් ප්‍රතිපත්ති අතරින් අස්තිත්ත්වය විසින් කරනු ලබන තෝරා ගැනීම ඇතුළුව විශේෂ ගිණුම් කරන ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම සමහර SLFRS මගින් විශේෂිතව අවශ්‍ය කෙරේ. උදාහරණ වශයෙන් දේපොළ පිරියත සහ උපකරණවල පන්තීන් සඳහා භාවිතකළ මැනීමේ පදනම් හෙළිදරව් කිරීම LKAS 16 මගින් අවශ්‍ය කෙරේ.

120 <u>[ඉවත් කරන ලදී]</u> <u>එම වර්ගත් අස්තිත්ත්වයක් සඳහා එහි මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්ට හෙළිදරව් කිරීම අපේක්‍ෂා කරණ එහි මෙහෙයුම්වල ස්වභාවය සහ ප්‍රතිපත්ති සෑම අස්තිත්ත්වයක්ම සළකා බැලේ. උදාහරණ වශයෙන් ආදායම් බදුවලට යටත් අස්තිත්ත්වයක, විලම්බිත බදු වගකීම් සහ ආදායම්වලට අදාළ වන දෑ ඇතුළුව ආදායම් බදු සම්බන්ධයෙන් වන අස්තිත්ත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හෙළිදරව් කිරීම පරිශීලකයෙකු විසින් අපේක්‍ෂා කෙරේ. අස්තිත්ත්වයකට සැළකිය යුතු අන්දමේ විදේශ මෙහෙයුම් හෝ විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු ඇති විටක විදේශ විනිමය ප්‍රතිලාභ හෝ අලාභ හඳුනා ගැනීම සඳහා අස්තිත්ත්වයක් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීම පරිශීලකයකු අපේක්‍ෂා කෙරේ.</u>

121 ප්‍රවර්තන කාලපරිච්ඡේදය සහ පෙර කාලපරිච්ඡේද සඳහා වන වටිනාකම් ප්‍රමාණාත්මක නොවූවත් අස්තිත්ත්වයක මෙහෙයුම්වල ස්වභාවය නිසා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් වැදගත් විය හැකිය. SLFRS මගින් නිශ්චිත අවශ්‍ය නොකරන්නන් වුව ද අස්තිත්ත්වයන් LKAS 8 තෝරා ගෙන ව්‍යවහාර කරන්නේ නම් ඒ අනුව සෑම වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හෙළිදරව් කිරීම එළෙසම උචිත වේ.

**122 අස්තිත්ත්වයක් ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යවහාර කරන ක්‍රියාවලියේදී කලමනාකරණය විසින් කරන ලද ඇස්තමේන්තු වලට සම්බන්ධ (125 වන ඡේදය) සහ මූල්‍ය ප්‍රකශනවල හඳුනාගත් වටිනාකම් වල වඩාත් සැලකිය යුතු අන්දමේ බලපෑමක් ඇති දෑ හැර අස්තිත්ත්වයක් එහි වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෝ වෙනත් සටහන්, විනිශ්චයන් <u>සාරාංශයක සමඟ කැටිව</u> හෙළිදරව් කළ යුතුය.**

...

**සංක්‍රාන්තිය සහ බලාත්මක දිනය**

...

139අඇ. හෙළිදරව් කිරීමේ මුල පිරීම (LKAS 1 ට සංශෝධන) 10, 31, 54 - 55, 82 අ, 85, 113-114, 117, 119 සහ 122 ඡේද සංශෝධනය කර ඇත; 30 අ 55 අ සහ 85 අ - 85 -ආ ඡේද එකතු කර ඇත. සහ 115 සහ 120 ඡේද ඉවත් කර ඇත. 2016 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා අස්තිත්ත්වයක් එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය. කලිං ව්‍යවහාර කරනයට අවසර දේ. මෙම සංශෝධන සඳහා LKAS 8 හි 28 - 30 ඡේදවලින් අවශ්‍ය කරන තොරතුරු අස්තිත්ත්වයන් හෙළිදරව් කිරීම අවශ්‍ය නොකෙරේ.

**වෙනත් ප්‍රමිතවලට ආනුෂංගික හෙළිදරව් කිරීම**

## SLFRS 7 මූල්‍ය සාධන පත්‍ර : හෙළිදරව් කිරීම්

21 වන ඡේදය සංශෝධනය කෙරේ සහ 44 ආ ඡේදය එකතු කර ඇත. ඉවත් කළ පාඨය කපා හැර ඇත සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

21. LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රකාරව අස්තිත්ත්වයන් එහි සාරාංශයේ එහි වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම සඳහා අදාළ වන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිත කළ මැනීමේ පදනම (පදනම්) වෙනත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත අස්තිත්ත්වයක් හෙළිදරව් කෙරේ.

...

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

...

44ආආ. හෙළිදරව් කිරීමේ මුල පිරීම (LKAS 1 ට සංශෝධන) 21 සහ ආ 5 ඡේද සංශෝධනය කර ඇත. 2016 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා අස්තිත්ත්වයක් විසින් එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය. එම සංශෝධන කලින් ව්‍යවහාර කිරීම සඳහා අවසර දේ.

ආ පරිශිෂ්ටයේ ආ 5 ඡේදය සංශෝධනය කර ඇත. ඉවත් කළ පාඨය කපා හැර ඇත සහ නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත.

**වෙනත් හෙළිදරව් කිරීම් - ගිණුම්කරණ ප්‍රතිපත්ති (21 වන ඡේදය)**

ආ5 මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීමට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කළ මැනීමේ පදනම (පදනම්) සහ වෙනත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම 21 වන ඡේදයෙන් අවශ්‍ය කෙරේ. මූල්‍ය ප්‍රකාශන සඳහා එවැනි හෙළිදරව් කිරීම් වලට ඇතළත් විය හැක්කේ;

(අ) ...

LKAS 1 හි 122 ඡේදය මගින් එලෙසම අස්තිත්ත්වය හෙළිදරව් කිරීම අවශ්‍ය කෙරේ. අස්තිත්ත්වයක් ගිණුම් කරන ප්‍රතිපත්ති ව්‍යවහාර කරන ක්‍රියාවලියේදී කලමනාකාරිත්වයේ ගණුදෙනු ඇස්තමේන්තු කිරීම සම්බන්ධයෙන් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෝ වෙනත් සටහන් විනිශ්චය සහ මූල්‍ය ප්‍රකාශ තුළ

හඳුනාගත් වටිනාකම්වලට වඩාත් සැලකිය යුතු අන්දමේ බලපෑමක් ඇති දෑ සමඟ අස්තිත්ත්වය හෙළිදරව් කිරීම අවශ්‍ය කෙරේ.

## LKAS 34 අතුරු මූල්‍ය වාර්තාකරණය

| |
|---|
| 5 වන ඡේදය සංශෝධනය කර ඇත සහ 27 වන ඡේදය එකතු කර ඇත. ඉවත් කළ පාඨය කපාහැර ඇත සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

### අතුරු මූල්‍ය වාර්තාකරණ අන්තර්ගතය

5. සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පහත සඳහන් සංරචකයන් ඇතුළත් ලෙස LKAS 1 නිර්වචනය කරයි.

(ඉ) වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය ඒ සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරුවලින් සමන්විත, සටහන්:

...

### බලාත්මක දිනය

57. හෙළිදරව් කිරීමේ මුල පිරීම (LKAS 1 සංශෝධන) 5 වන ඡේදය සංශෝධනය කර ඇත. 2016 ජනවාරි 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා අස්තිත්ත්වයක් එම සංශෝධන ද ව්‍යවහාර කළ යුතුය. කලින් ව්‍යවහාරකරණය සඳහා අවසර දේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.